# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2024 අංක 29 දරන සවීර පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජුනි මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 ජුනි මස 14 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 24.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2024 අංක 29 දරන සවීර පදනම**
**(සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2024 ජුනි මස 12 වන දින]

එල්.ඩී.–ඕ.(අයි. එන්. සී.)22/2022

## සවීර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

“සවීර පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමේ පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී පදනමට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2024 අංක 29 දරන සවීර පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) "සවීර පදනමෙහි" දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයට මින්මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාපිත මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) “සවීර පදනම” යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එම සංස්ථාපිත මණ්ඩලය විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, එය භාවිත කිරීමට ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද, පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය. සවීර පදනම සංස්ථාගත කිරීම

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** (1) සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එකී පොදු පරමාර්ථ, අදාළ යම් ලිඛිත නීතියකට යටත් ව, එකී ලිඛිත නීතිය මඟින් අවසර ලබා දී ඇති තාක් ප්‍රමාණයට, අදාළ අධිකාරීන්ගේ එකඟත්වය මත—

(අ) ශ්‍රී ලාංකික පුරවැසියන් අතර ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුක්තව අවශ්‍ය පුහුණුව සහ සහයෝගය ඔවුන් වෙත ලබාදීම සඳහා; සහ

(ආ) තරුණයන්ගේ නායකත්ව කුසලතා සහ පෞරුෂය වර්ධනය කිරීමට වැඩසටහන් පැවැත්වීම සඳහා,

එම අධිකාරීන්ට සහාය වීම පිණිස විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, සංස්ථාපිත මණ්ඩලය විසින් වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනත් කවර හෝ හේතුන් මත පදනම්ව කිසිදු වෙනස්කමකට භාජනය නොකර එම ක්‍රියාත්මක කිරීම සිදුකිරීමට වගබලා ගත යුතු ය.

රජයේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමඟ කිසිදු ගැටුමක් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය විසින් වගබලා ගත යුතු බව

**4.** සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සහ රජයේ හෝ යම් පළාත් සභාවක කිසියම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව කරගෙන යනු ලබන යම් කාර්යයක් අතර කිසිදු ගැටුමක් ඇති නොවන ආකාරයෙන් සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතීවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය කිරීම, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් ධුර දරන්නන් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ මණ්ඩලයේ ධුර දරන්නන් විසින්, මේ උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් දක්වා ඇති ආකාරයට පළමු මණ්ඩලය පත් කරගනු ලබන තෙක් හෝ තෝරා පත් කරගනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයක් වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා රීති සකස් කිරීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයට බලතල ඇත්තේ ය.

(ඇ) එහි පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය විසින් සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයේ යම් තීරණයක් ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ පළමු මණ්ඩලය, පත් කරගනු හෝ තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුළුව මණ්ඩලයේ සෑම ධුර දරන්නකු ම, අවුරුදු තුනක කාලසීමාවක් සඳහා පත්කර ගනු ලැබිය යුතු හෝ තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර, එකී අවුරුදු තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව, එකී යම් ධුර දරන්නකු, අනුශාසකවරයකු හෝ උපදේශකවරයකු නැවත පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, අශක්නුතාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් පුරප්පාඩුවක් ඇතිවන

අවස්ථාවක, මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) වන ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා විසින්, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුර දරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල ඇතුළුව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන පරිදි එවැනි සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටුකිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලතල සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය:-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සංස්ථාපිත මණ්ඩලය විසින් ඍජුව ම හෝ තත්කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් බලය ලබාදුන් යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් සියලු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට එළඹීම සහ ඒවා ඉටු කිරීම හෝ කරගෙන යාම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා ඇප සහිතව හෝ රහිතව අරමුදල් ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය සිදු කරනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යනුකූල භාරයක් හෝ යම් නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති ප්‍රකාරව සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන්ට යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය සහ විදේශීය ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම; සහ

(ඔ) සාමාන්‍යයෙන්, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා මේ පනත මඟින් බලය පවරන ලද සියලු ක්‍රියා සහ දෑ සිදු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, කලින් කලට, සංස්ථාපිත මණ්ඩලයේ යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය ලබාදෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ යː-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම හෝ ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීමේ නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය සහ කාර්ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ සහ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පවත්වාගෙන යාමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය හෝ එකී රැස්වීම් පිළිබඳ නිවේදන සහ න්‍යාය පත්‍රය, ගණපූරණය සහ ඒකී රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) මණ්ඩලයේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා වන සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටුකර ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී, සහ එවැනිම වූ ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති එකී රීති සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, *ගැසට් පත්‍රයේ* සඳහන් වන දින සිට එම රීති බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද සෑම රීතියක් ම, එම රීති *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් රීතියක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගති විරහිතව, එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ එසේ යම් රීතියක් පරිච්ඡින්න කරනු ලැබූ බවට සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

(6) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම අවස්ථාවන් හි දී ම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ නාමලේඛනය

8. මණ්ඩලය විසින් සාමාජිකයන්ගේ නම්, ලිපිනය සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලය වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල් 6(ඇ) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් අනුමත කරනු ලබන එක් බැංකුවක හෝ ඊට වැඩි සංඛ්‍යාවක සංස්ථාපිත මණ්ඩලයේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, එම සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තකු; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) මණ්ඩලය විසින්, එක් එක් මුදල් වර්ෂය සඳහා සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර තරුණ කටයුතු පිළිබඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කළ ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත ලැබුණු විදේශීය සහ දේශීය මුදල් පිළිබඳ වෙන ම ගිණුම් ප්‍රකාශයක්, (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනම වෙත අයවිය යුතු සියලු ණය සහ පදනමට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**13.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාරව හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, නීතියෙන් සංස්ථාපිත මණ්ඩලය වෙත බලය සහ හැකියාව තිබිය යුතු අතර, එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් එය නීයාදනය කිරීමේ බලතල සහිතව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, සහ මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් එම සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ හුදෙක්ම සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් හෝ අන්‍යාකාරයකින් කවර හෝ ලෙස සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වෙත සෘජුව හෝ වක්‍රව ගෙවනු හෝ පවරනු නොලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ ස්වකීය නම් අත්සන් කළ යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කවර හෝ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි එම මණ්ඩලයේ ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමෙන් පසුව, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, එම දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති මගින් යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් උචිත ආයතනයකට එම දේපළ ලබා දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින්, මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය ලබා දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** මේ පනතේ ඇතුළත් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් සංස්ථාවක අයිතිවාසිකම්වලට හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අර්ථ නිරූපනය

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"බැංකුව" යන්නට, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභී බැංකුවක් අදහස් වේ; සහ

"ලිඛිත නීතිය" යන්නට, අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එම යෙදුමට පවරා ඇති අර්ථය ම තිබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.